**සිංහල පරිවර්තනය**

## උතුරු පළාතේ පිහිටි දෙමළ මාධ්‍යය මගින් වූ පාසල්වල අ.පො.ස (උ/පෙ) ගණිතය, විද්‍යා අංශයේ හා ඉංග්‍රීසි පාඩම යන විෂයයන්ට පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තිය - 1(අ) ශ්‍රේණියේ තනතුරට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – *2020*

උතුරු පළාතේ පිහිටි දෙමළ මාධ්‍යය මගින් වූ පාසල්වල ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තිය - 1(අ) ශ්‍රේණියේ තනතුරට **ඇමුණුම - 01 හි** සඳහන් පරිදි පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා **ඇමුණුම - 02 හි** සඳහන් විෂයයන්ට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබති. **ඇමුණුම - 01 හි** සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පැවැත්වීමට නියමිත බව දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය *23.12.2020* වේ.

## *02.* බඳවා ගැනීමේ සේවා කොන්දේසි

*2.1* **අංක 1885/38** හා *2014.10.23* වන දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාවේ නියම කර ඇති කොන්දේසීන්ට හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට ද, මුදල් රෙගුලාසිය හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** හා *2013.07.03* වන දින දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයට අදාළ ආයතන කාර්ය පටිපාටීන් යනාදියට යටත්ව, තෝරා ගන්නා විභාග අපේක්ෂකයන් අදාළ තනතුරේ 3 වන පන්තියේ 1(අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ

*2.2* මෙම විභාගයෙන් සමත් වන විභාග අපේක්ෂකයන් පත්වීමේ දින සිට වසර තුනක කාලපරිච්ඡේදයක පරිවාස කාලයකට යටත් කොට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිරය විශ්‍රාම වැටුප් සහිතය.

*2.3* මෙම සේවය ස්ථානමාරුවලට යටත් වූ සේවයකි. එබැවින් පත්වීම් ලබන විභාග අපේක්ෂකයන් උතුරු පළාතේ නියම කරනු ලබන කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුයි යන නියෝගයට බැඳී සිටිය යුතුයි.

*2.4* පත්වීම් සංඛ්‍යාව හා එය ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. නිවේදනයේ සඳහන් පුරප්පාඩු සංඛ්‍යාවෙන් කිසියම් පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

## *03.* වැටුප් පරිමාණය

3 වන පන්තිය - 1(අ) ශ්‍රේණියේ තනතුරට නව පත්වීම් ප්‍රදානය කරන ගුරුවරයෙක් පත්වීම් ක්‍රියාත්මක වන දින සිට අංක *03/2016* දරණ *2016.02.25* දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි, **GE 1-2016** වැටුප් කේත අංකය වන **රුපියල් 27,740 – 6 x 300 – 7 x 380 – 2 x 445 – 33,090** ක් මාසික වැටුප් පරිමාණයේ, උප ලේඛන I හි සඳහන් පරිදි *14* වන වැටුප් පියවරේ රුපියල් ***32,200/-*** හි පිහිටුවනු ලැබේ. එයට අමතරව රජය විසින් රජයේ නිලධාරීන්ට කලින් කලට ප්‍රදානය කරන දීමනාද ලැබීමේ හිමිකම ඇත.

## *04.* සාමාන්‍ය සුදුසුකම්

*04.1* සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

*04.2* අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. මෙම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පෙර වූ වසර හයකින් *(06)* අවම වශයෙන් වසර තුනක් *(03)* හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුයි.

**හෝ**

අයදුම්කරුගේ හෝ දෙමව්පියන්ගේ උපන් ස්ථානය උතුරු පළාත විය යුතුයි අවම වශයෙන් වසර *05)* හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුයි. **(*සම්මුඛ පරීක්ෂණයේ දී ඡන්ද නාම ලේඛනයෙන් උපුටා ගන්නා ලද නාම ලේඛනයේ සහතික කරන ලද පිටපත ඉදිරිපත් කළ යුතුයි)**

*04.3* අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය කායික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

*04.4* අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය වන විට හෝ එදිනට ප්‍රථම අයදුම්කරුවන් **සුදුසුකම් සියල්ල සපුරා** තිබිය යුතුයි.

## 04.5 වයස් සීමාව

අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය වන විට අයදුම්කරුගේ **වයස අවුරුදු *18* නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි** විය යුතුයි.

## *05.* අධ්‍යාපන සුදුසුකම්

*05.1* **අංක *1885/38*** දරණ**2014.10.23**වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාවට ද අනුව **23.12.2020දිනට** හෝ ඊට ප්‍රථම අධ්‍යාපන විෂයභාර රේඛීය අමාත්‍යාංශයෙන් ගුරු පත්වීමට අදාළව අනුමත කරන ලද විශේෂ විෂයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත කරන ලද උපාධි ප්‍රදාන ආයතනයක් මඟින් ප්‍රදානය කරන ලද විශ්වවිද්‍යාල උපාධියට සමාන සුදුසුකම් සහිත උපාධි සහතිකයක් (**ඇමුණුම - 02 හි** සඳහන් පරිදි) ලබා තිබිය යුතුයි. ප්‍රතිඵල බලාපොරොත්තු වෙමින් සිටින අතරතුර ඉදිරිපත් කරන අයදුම්පත්‍ර හා ඉල්ලා ඇති අධ්‍යාපන සුදුසුකම් සපුරා නැති අයදුම්පත්‍ර ද කිසිදු පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*05.2* ***05.1*** සුදුසුකම් සමඟ අතිරේකව අ.පො.ස (සා/පෙ) විභාගයෙන් සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සමත්වී තිබිය යුතුයි.

## *06.* බඳවා ගැනීමේ ක්‍රමය

*06.1* තරග විභාගයෙන් අවම වශයෙන් ලකුණු *40%* ක් ලබාගන්නා අපේක්ෂකයන් ගෙන් පුරප්පාඩු සංඛ්‍යාවට අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ තනතුරට කැඳවන ලද සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලැබේ. කෙසේ වුවද සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු කිසිවක් ප්‍රදානය නොකරන අතර සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන්නන් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ***11.2* හි සඳහන් පරිදි** ප්‍රායෝගික පරීක්ෂණයට ලකුණු ප්‍රදානය කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය, ලිඛිත පරීක්ෂණය යන පරීක්ෂණ වලින් ලබා ගත් ලකුණු ප්‍රමාණයේ එකතුව තුළින් කුසලතා අනුපිළිවෙල පදනම් කර (Merit Order) ඒ අනුව පාසල පදනම් කරගත් ක්‍රමවේදයක් මඟින් පවතින පුරප්පාඩු සඳහා පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

*06.2* පත් කරන පාසල සම්බන්ධයෙන් පත්වීම් බලධාරියාගේ තීරණයට අයදුම්කරුවන් යටත් විය යුතුයි. එම තීරණයන් සම්බන්ධයෙන් අයදුම්කරුවන් විසින් අභියාචනා කිසිවක් ඉදිරිපත් කළ නොහැකිය.

*06.3* පුරප්පාඩු වලින් *03%* ආබාධිතයන් සඳහා (ආබාධිත) වෙන් කරනු ලැබේ. විභාග අපේක්ෂක පත්වීම සඳහා තෝරා ගන්නා විට තම ආබාධිත තත්වය(Disability) සේවය කිරීමට බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මඟින් ඔප්පු කළ යුතුයි

## 07. විභාග ගාස්තු

අයදුම්කරු පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රුපියල් ***500.00*** ක් ගෙවා **"ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ ***"3401"*** යන තැන්පත් ගිණුමට බැර කර ලබාගත් ලද කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාල කොටුව තුළ නොගැළවෙන ලෙස අලවා යොමු කළ යුතුයි. කුමණ හේතුවක් නිසා හෝ මෙම ගාස්තුව නැවත ගෙවනු නොලැබේ. එමෙන්ම මෙම ගාස්තුව වෙනත් විභාගයන් සඳහාද මාරු කිරීමට අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම්කරන ක්‍රමය

*08.1* මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක (සෙ.මී *21* x සෙ.මී*29*) අංක *1* සිට *10* දක්වා වූ කොටස් පළමු පිටුවේ ද අනෙක් කොටස් දෙවන පිටුවට ද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍ර සකස් කරගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **23.12.2020**වන දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි,**"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:** 393/48, **කොවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

*08.2* අයදුම්පත්‍රයේ අංක *01* යටතේ අයදුම්කරුගේ නම සඳහන් කරන විට සම්පූර්ණ නමේ අවසානයේ ඇති නම පළමු සඳහන් කර අනෙක් නම්වල සඳහන් මුලකුරු පසුව සඳහන් කළ යුතුයි.

***උදා*** *:-* අයදුම්පත්‍රයේ *01* හි SIVAKUMAR.K.S යනුවෙන් සඳහන් කළ යුතුයි.

*08.3* අයදුම්පත් යොමු කරන කවරයේ වම් ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා ගුරු සේවයේ 3වන පන්තියේ - 1 (අ) ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා විවෘත තරඟ විභාගය –*2020*"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

*08.4* අයදුම්පත්‍රයේ **ඡායා පිටපත** තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පත්‍රයේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත යනාදිය පිළිගන්නේ නැති අතර විභාග ප්‍රවේශපත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් යථා කාලයේදී එවනු ලැබේ. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම මඟින් අයදුම්කරු අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවන බව සැලකිල්ලට ගත යුතුයි.

*08.5* අයදුම්පත්‍ර යොමු කරන ලද අයදුම්කරුවන් අවම වශයෙන් විභාගය පැවැත්වීමට දින 03 කට කලින් හෝ ප්‍රවේශ පත්‍ර නොලැබුණේ නම්, ඒ බව අදාළ පහත සඳහන් විස්තර සමඟ **, ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කොවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්වීමට කටයුතු කළ යුතුයි. (දුරකථන අංකය *–021 221 9939*, ෆැක්ස් අංකය *-021 221 9940)*

**එවිය යුතු ලේඛන හා තොරතුරු :-**

**ලිපියක්, අයදුම්පතේ සහතික කරන ලද පිටපත, විභාග ගාස්තු ගෙවන ලද සහතික කරන ලද පිටපත, ප්‍රවේශපත්‍ර යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.**

*08.6* **අයදුම්කරුවන් තම අත්සන සහතික කර ගැනීම අනිවාර්ය වේ.**

රජයේ ආයතනයකින් අයදුම් කරන_අයදුම්කරු තම අත්සන ආයතන ප්‍රධානියා මඟින් හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධරයකු ලවා අත්සන සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි, සාමවිනිසුරු, දිවුරුම් ප්‍රකාශක නිලධාරි, නීතිඥ, නොතාරිස්, නාවික හමුදා, යුධහමුදා, ගුවන් හමුදාවන්හි නියෝගලත් නිලධරයකු, රුපියල් 498,960.00 ට නොඅඩු වටිනාකමක් ඇති වාර්ෂික වැටුපක් ලබන ස්ථිර රජයේ නිලධරයකු හෝ පළාත් පාලන හෝ පළාත් සභා නිලධරයකු, ආගමික නිකායන් භාරව කටයුතු කරන පූජක පක්ෂය යනා අයගෙන් කෙනෙකු සහතික කර ගත යුතුයි.

## *09.* විභාග අපේක්ෂකගේ අනන්‍යතාවය

තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි මේ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එක් ලියවිල්ලක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුණුම්පත

(ii) වලංගු විදෙස් ගමන් බලපත්‍රය.

(iii) වලංගු රියදුරු බලපත්‍රය.

ඉහත ලියකියවිලි වලින් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයකුගේ විභාග අපේක්ෂකත්වය**"පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාතේ ලේකම්වරයාගේ,"** අභිමතය පරිදි අවලංගු කිරීමට අවස්ථාව ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් නියම කරනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් විය යුතුයි.

## *10.* අසත්‍ය තොරතුරු සඳහා අඩුවම

අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුයි. විභාග රීතින් අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථම හෝ විභාගයට පසුව හෝ කුමණ අවස්ථාවකදී හෝ 'සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් ඔහුට හිමි විභාග අපේක්ෂකත්වය එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ අයදුම්කරුවෙකු ඉදිරිපත් කරන කිසියම් තොරතුරක් අව්‍යාජ බව පත්වීමෙන් පසු අනාවරණය වුවහොත් පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

## 11. විභාග සැලැස්ම

### 11.1 ලිඛිත විභාගය

මෙම පරීක්ෂණය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. දෙමළ හා සිංහල මාධ්‍යය මගින් මෙම විභාගය පැවැත්වෙන අතර අයදුම් කළ භාෂා මාධ්‍යය පසු වෙනස් කළ නොහැකිය.

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය මාලාව | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | ගුරු සේවයට අදාළව ගුරු භවතෙකු තුළ දක්නට ලැබෙන හැකියාවන් පිළිබඳ තර්කානුකූල දැනුම සම්බන්ධයෙන් අගය කිරීමේ අරමුණින් මෙම ප්‍රශ්න පත්‍ර සකස් කරනු ලැබේ. මෙය බහුවරණ තේරීම් හා කෙටි පිළිතුරු සැපයීමට පහසු වන පරිදි ප්‍රශ්න 50 ක් ඉදිරිපත් කර ඇති අතර ප්‍රශ්න සියල්ලටම කෙටියෙන් පිළිතුරු සැපයිය යුතුයි. | පැය 01 | 100 |
| 02 | සාමාන්‍ය දැනුම | විභාග අපේක්ෂකයන් හට ගුරු ක්ෂේත්‍රයට අදාළව දක්නට ලැබෙන සාමාන්‍ය දැනුම, ස්වෛදේශීය වශයෙන් පැනනැගුණ හා පැන නැගිය හැකි අධ්‍යාපන කටයුතුවල වර්ධනය සම්බන්ධයෙන් වූ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම ට පහසු වන පරිදි බහුවරණ තේරීම් හා කෙටි ප්‍රශ්න අඩංගු ප්‍රශ්න පත්‍රයක් වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි. | පැය 01 | 100 |

**සැ.යු** :-

මෙම විභාගය තරග විභාගයක් වන බැවින් ප්‍රායෝගික පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට ප්‍රශ්න පත්‍ර සියල්ලටම වෙන්කර ඇති ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහක්(40%) විභාග අපේක්ෂකයන් ලබාගත යුතුයි.

### 11.2 ප්‍රායෝගික පරීක්ෂණය

ලිඛිත පරීක්ෂණයෙන් සමත්වූ අපේක්ෂකයන් ප්‍රයෝගික පරීක්ෂණයට අයදුම්කරුවන් විසින් අමුණා ඇති මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීම් කළ යුතුයි. ඒ සඳහා පහත සඳහන් පරිදි ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

| ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලකුණු ලබා දෙන සංසන්දනයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අරමුණ හා ප්‍රවේශය<br>**(Objective and the Approach)** | 05 | 02 |
| 02. පෞරුෂත්වය හා පාලනය<br>**(Personality and Voice Control)** | 05 | 02 |
| 03. සන්නිවේදන උපාංග පිළිබඳ පැහැදිලිභාවය<br>**(Clarity in the Communication)** | 05 | 02 |
| 04. කාල කළමනාකරණය<br>**(Time Management)** | 05 | 02 |
| 05. ඉදිරිපත් කිරීමේ හැකියාව<br>**(Usage of Techniques of Presentation)** | 05 | 02 |
| **සම්පූර්ණ ලකුණු ප්‍රමාණය** | **25** | **10** |

## 12. ප්‍රායෝගික පරීක්ෂණය :-

විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභා වෙබ් අඩවිය මගින් නිකුත් කරනු ලැබේ. ඉන් අනතුරුව විභාගයට පෙනී සිටි සෑම විභාග අපේක්ෂකයන් වෙත තැපැල් මගින් යොමු කරනු ලැබේ.

*13.* **විභාග මධ්‍යස්ථාන :-**

විභාග පැවැත්වීමට අපේක්ෂිත නගර හා එම නගර අංක පහත සදහන් පරිදි වේ,

| ***නගරය*** | ***නගර අංකය*** |
|---|---|
| යාපනය | *01* |
| මන්නාරම | *02* |
| වවුනියාව | *03* |
| කිලිනොච්චිය | *04* |
| මුලතිව් | *05* |

විභාග නගරයකින් ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව, තීරණය කරනු ලබන සංඛ්‍යාවේ අඩුවක් ඇති බව නිරීක්ෂණය වන විට ආසන්න නගරයට විභාග සදහා යොමු කරනු ලැබේ.

***14.*** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට ඇත. මෙම දැන්වීමේ දෙමළ හා සිංහල භාෂා මාධ්‍යයන් අතර යම්කිසි නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් දක්නට ලැබෙන විට දෙමළ භාෂා මාධ්‍යයේ නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**එස්. තිරුවාකරන්,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
*23.11.2020*

**ඇමුණුම - 01**

**විෂයට අදාළ පුරප්පාඩු පිළිබඳ විස්තර**

| අංක | විෂය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01. | **භෞතික විද්‍යාව** | 03 |
| 02. | **රසායනික විද්‍යාව** | 03 |
| 03. | **ඒකබද්ධ ගණිතය** | 06 |
| 04. | **ජීව විද්‍යාව** | 03 |
| 05. | **පොදු ඉංග්‍රීසි භාෂාව** | 37 |
| **සම්පූර්ණ ගණන** | | **52** |

**ඇමුණුම - 02**

**විෂය ගණය හා මූලික අධ්‍යාපන සුදුසුකම්**

| විෂය අංකය | විෂය ගණය | අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| **I** | භෞතික විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයක **භෞතික විද්‍යාව** විෂය ප්‍රධාන විෂය ලෙස හා විශිෂ්ඨ විෂයයන්ගෙන් එක් විෂයක් ලෙස භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යා අංශයෙන් විද්‍යාවේදී උපාධිධාරියෙක් විය යුතුයි. |
| **II** | රසායනික විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයක **රසායනවේදී විෂය** ප්‍රධාන විෂය ලෙස හා විශිෂ්ඨ විෂයයන්ගෙන් එක් විෂයක් ලෙස භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යා විද්‍යාවේදී උපාධිධාරියෙක් විය යුතුයි. |
| **III** | ඒකබද්ධ ගණිතය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයක **ව්‍යවහාරික ගණිතය හා ශුද්ධ ගණිතය යන විෂයන්** ප්‍රධාන විෂයන් ලෙස හා **ව්‍යවහාරික ගණිතය/ශුද්ධ ගණිතය** යන විෂයයන් ගෙන් කුමක් හෝ එක් විෂයක් විශිෂ්ඨ විෂයක් කර ගත් විද්‍යාවේදී උපාධිධාරියෙකු විය යුතුයි. |
| **IV** | ජීව විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයක **ජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව** හ සත්ව විද්‍යාව යන විෂයන් ප්‍රධාන විෂයන් කරගත් හෝ **උද්භිද විද්‍යාව/සත්ව විද්‍යාව** යන විෂයයන් ගෙන් එක් විෂයක් විශිෂ්ඨ විෂයක් කරගත් ජීව විද්‍යාවේදී උපාධිධාරියෙකු විය යුතුයි. |
| **V** | පොදු ඉංග්‍රීසි භාෂාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයක **ඉංග්‍රීසි පාඨම** ප්‍රධාන විෂයයන් ගෙන් එක් විෂයක් කරගත්/විශිෂ්ඨ විෂයක් කරගත් ශාස්ත්‍රවේදී උපාධිධාරියෙකු විය යුතුයි. |